**ආයුර්වේද වෛද්‍ය සභාව - 2015**

**----------------------------------------------**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11 සිට 21 දක්වා වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට උපචිත ආධුනික පුහුණු දීමනා රු.22,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.99,250 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂාව අනුව වෛද්‍ය සහතික පොත් ඉතිරි තොගයේ පිරිවැය රු.398,928 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.378,912 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වන මුදල් ප්‍රවාහයන් නිශ්චිත ලෙස හඳුනාගෙන සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු අතර, සිදුකර තිබුණු ගැලපීම් සැළකීමේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළනය කළ ආකාරය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. එවැනි ගැලපීම්වලට උදාහරණ කිහිපයක් පහතින් දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය රු.485,504 ක් අතිරික්තයට එකතුකළ යුතු නමුත් ඒ වෙනුවට රු.210,371 ක් අතිරික්තයෙන් අඩුකර දක්වා තිබුණි.

(ii) ස්ථාවර වත්කම් විකිණීමෙන් වූ අලාභය රු.87,810 ක් වර්ෂයේ අතිරික්තයට ගළපා නොතිබුණු අතර වත්කම් විකිණීමෙන් ලද මුදල රු.11,100 ක් මුදල් ගලා ඒමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(iii) මූල්‍ය චලනයට බලපෑමක් සිදුනොවන පූර්ව වර්ෂ ගැලපීම් රු.235,515 ක් හා සංචිත වෙනස්වීම් රු.43,454 ක් වර්ෂයේ අතිරික්තයට එකතුකර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණු මුදල රු.52,850 ක් වුවද එය රු.741,935 ක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව ඉවත්කළ වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය වෙන්කිරීම් වටිනාකම පිළිවෙලින් රු.794,785 ක් හා රු.695,875 ක් වුවද

වත්කම් ඉවත් කිරීමේ ලේඛනය අනුව එම වටිනාකම පිළිවෙලින් රු.875,604 ක් හා රු.764,827 ක් විය. ඒ අනුව පිළිවෙලින් රු.80,819 ක හා රු.68,952 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඉකුත් වර්ෂ 05 කදී හා සමාලෝචිත වර්ෂය තුළදී වාහන කුලී ලෙස වැයකර තිබුණු මුළු මුදල පිළිවෙලින් රු.2,475,023 ක් හා රු. 542,050 ක් වූ නමුත් වාහනයක් කුලියට ගැනීමේ රාජකාරිමය අවශ්‍යතාවය, ගමන් කළ ස්ථාන පිළිබඳ තොරතුරු, ධාවනය කළ දුර, කුලී රථ සපයනු ලබන ආයතනය සමඟ එළඹි ගිවිසුම් යනාදිය විගණනය සඳහා ඉදිරිපත් නොවූ බැවින් මෙම ගණුදෙනුවල නිවැරදිතාවය තහවුරුකරගැනීමට විගණනයේදී නොහැකි විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ II(1)(ඉ) වගන්තිය | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකු සභාවේ සාමාජිකයින් ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සාමාජිකයින් තිදෙනා පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව සහ අංක 1884/36 දරන 2014 ඔක්තෝබර් 15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වෙත වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කර නව සහතිකයක් නිකුත් කළ යුතු නමුත් 2015 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචිය යාවත්කාලීන කළ වෛද්‍යවරු 2,241 ක් වෙත නව ලියාපදිංචි සහතික නිකුත් කර නොතිබුණු අතර ලියාපදිංචි නොවූ වෛද්‍යවරුන් හඳුනාගෙන ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | (i) VII වන පරිච්ඡේදයේ 12:2:1, 12:2:2 හා 12:2:3 වගන්ති | වැඩ බැලීමට පත්කරන තනතුර ඔහු දරන නිත්‍ය තනතුරට ඉහළ තනතුරක් විය යුතු වුවද ලේඛකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා 2013 ජූලි මාසයේ සිට ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු පත්කර තිබුණි. 2016 ජූලි මාසය වන විට වර්ෂ 03 ක් ගතවී තිබුණද, එම තනතුරට නිත්‍ය නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) XXIV පරිච්ඡේදයේ 3.5 වගන්තිය | වැටුපෙන් සියයට 40 ක් දක්වා ණය වාරික හා වෙනත් අඩුකිරීම්වල උපරිම සීමාව පිළිබඳ නොසළකා සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් තිදෙනෙකු වෙත එකතුව රු.276,000 ක ආපදා ණය නිකුත්කර තිබුණි. තවද සේවා කාලය වර්ෂ 5 |

සම්පූර්ණ නොකළ නිලධාරිනියකට ඇප රහිතව රු.71,700 ක ආපදා ණයක් නිකුත් කර තිබුණි.

**(ඇ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 169 | 2006 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ලැබී තිබුණු මුදල් ඇණවුම් 22 ක් උපලබ්ධිවීමට පෙර රු.13,030 ක සේවා සපයා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 177 | එකතුකර ගන්නා රජයේ මුදල් දිනපතා හෝ හැකිතාක් ඉක්මනින් බැංකුගත කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.494,638 ක මුදලක් දින 5 සිට 10 දක්වා ප්‍රමාදයකින් යුතුව බැංකු ගත කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.5,180,161 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් 2016 ජූනි 31 දින වන විටත් භෞතික සමීක්ෂණ සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය.

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.712,624 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,376,367 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,663,743 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රතිපාදන රු.2,500,000 කින් අඩුවීම හා සාමාන්‍ය පොදු වියදම් රු.1,212,185 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2011 හා 2012 වර්ෂවල ඌනතාවයක් ලබා තිබුණද 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ අතිරික්තයක් ලබා තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී සභාවේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2014 වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සියයට 79 කින් පිරිහීමත් සමඟම දායකත්වයද සියයට 20 කින් පිරිහී රු. 6,568,561 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය.

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 03 කොටසෙහි 18 වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද වෛද්‍ය සභාවේ ප්‍රධාන අරමුණු පහත පරිදි විය.

* ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ පනතෙහි කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

* ආයුර්වේද වෛද්‍යවරයන්, ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හා ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම, එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

* ආයුර්වේද වෛද්‍යවරුන්ගේ, ආයුර්වේද ඖෂධ සංයෝජකයන්ගේ හා ආයුර්වේද සාත්තු සේවකයන්ගේ වෘත්තීය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම යන අරමුණුවලට අදාළ ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ නව වෛද්‍යවරු ලියාපදිංචිවීම සියයට 44 ක ප්‍රතිශතයකින් අඩුවී තිබුණු අතර මෙයින් පාරම්පරික හා පාරම්පරික විශේෂ වෛද්‍යවරු ලියාපදිංචිය පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 65 කින් හා සියයට 78 කින් අඩුවී තිබුණි. ලියාපදිංචිය සඳහා ලැබෙන අයදුම්පත්‍ර සම්බන්ධව ක්‍රියාකිරීමේ කාල ප්‍රමාදය ඊට හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාජ වෛද්‍යවරු සම්බන්ධ පැමිණිලි 71 ක් ලැබී තිබුණු අතර ඉන් පැමිණිලි 40 ක් පමණක් විමර්ෂණය කර තිබුණි. ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර නොතිබුණු බැවින් එසේ විමර්ශනය කර තිබුණු බොහෝ පැමිණිලි අවවාද හා උපදෙස් ලබාදීම්වලට පමණක් සීමාවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු කාර්යයන් 05ක් ඉටුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ ලියාපදිංචිවී නොතිබුණු අයෙකු දෙහිවල ප්‍රදේශයේ ස්ථානයක ආයුර්වේද හා චීනකටු ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන බව තහවුරුවී තිබුණද, ඊට අදාළව පරීක්ෂණ පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිවී සිටියද තොරතුරු සොයාගත නොහැකි වූ වෛද්‍යවරු 1,626 ක් පිළිබඳව සභාව අප්‍රමාදව කටයුතු නොකිරීම නිසා එම අංක භාවිතා කර ව්‍යාජ වෛද්‍යවරු කර්මාන්තයේ නියැලීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණු පාලක සභා රැස්වීම් 06 ටම සහභාගී වී නොතිබු නමුත් ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

අවම ලංසු වටිනාකමක් තක්සේරු නොකර සමාලෝචිත වර්ෂය තුළදී පොත් අගය රු.98,910 ක් වූ ජංගම නොවන වත්කම් රු.11,100 කට සභාවේ නිලධාරීන්ට වෙන්දේසි කර තිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

--------------------------

ආයුර්වේද වෛද්‍ය වෘත්තීය සඳහා විදේශගතවන වෛද්‍යවරුන්ට නිකුත්කරන ජාත්‍යන්තර සහතික පත්වල වාර්ෂික සාමාන්‍ය නිකුතුව සහතික 13 ක් ව පැවතියදී සහ පැරණි සහතික පත් 1,910 ක් අත

ඉතිරිව තිබියදී වාර්ෂික අවශ්‍යතාවය පිළිබඳ සැළකිල්ලකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.38,454 ක් වැය කර නව ජාත්‍යන්තර සහතික පත් 500 ක් මුද්‍රණය කර තිබුණි. 2016 ජූනි 30 දින වන විට ඉන් එක් සහතික පතක් හෝ නිකුත්කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, වෛද්‍ය සභාවේ 2015 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 105 ක ප්‍රමාදයක් සහිතව 2016 ජූනි 15 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක පීඑෆ්ඞී/ආර්ඊඞී/01/04/2014/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත සහ තත්‍ය කාර්යය මණ්ඩල විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

---

සමාලෝචිත වර්ෂයේ වෛද්‍ය සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.4 විගණන කමිටු**

---

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

---

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 123 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---

වෛද්‍ය සභාවේ 2013 සහ 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2016 සැප්තැම්බර් 06 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| **(අ)** | ගිණුම්කරණය | ඇතැම් ගණුදෙනු ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගිණුම්ගත කර නොතිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව ජර්නල් සටහන් යොදා තිබීම. |
| **(ආ)** | ලේඛන පවත්වාගැනීම | නිවාඩු ලේඛනය විධිමත් පරිදි පවත්වා නොතිබීම, හා වෛද්‍ය සහතික ඇතුළු විවිධ සහතික පොත්වල ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවත්වා නොතිබීම. |